# දැන්වීමයි

## නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය
## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
## ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි විදුහල - OTC
## ගල්කුලම, අනුරාධපුරය

## 2026 වසර සඳහා ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීමයි

**මිල ගණන් අංකය : 1/4/7/00/160-2025**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අයත් අනුරාධපුර, ගල්කුලම, ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි විදුහලේ (ඕ.ටී.සී) කාර්ය මණ්ඩලයට සහ එම ආයතනයට පැමිණෙන අමුත්තන්ට නේවාසික සහ බාහිර පාඨමාලාවන් සඳහා පුහුණුවන්නන් හට ආහාරපාන සැපයීම සඳහා ආපනශාලාව පවත්වාගෙන යාමට මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

01. මුළුතැන්ගෙය සහිත ආපනශාලාව පරීක්ෂා කිරීම **2025.11.18** දින සිට **2025.12.08** දින දක්වා කාර්යාල වේලාවන් තුළ පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා සිදු කළ හැක.

02. මෙම ආපනශාලාව පවත්වාගෙන යාමට තෝරාගනු ලබන ආපනශාලා භාරකරුට ඉහත සඳහන් ලිපිනයෙහි අනුරාධපුර,ගල්කුලම,ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි විදුහලේ මුළුතැන්ගෙය අවශ්‍ය ආහාරපාන වර්ග පිළියෙල කර පිසීම සඳහා පාවිච්චි කිරීමට ඉඩදෙනු ලැබේ.

**2025.11.18** වෙනි දින සිට **2025.12.08** දින දක්වා සතියේ සාමාන්‍ය කාර්යාල දින වල පෙ.ව **09.30** සිට ප.ව **03.30** දක්වා ආපසු නොගෙවනු ලබන රු.1500.00 + (18% වැට් බදු) ක මුදලක් ඕටිසි ආයතනයේ මුදල් අයකැමි වෙත ගෙවා රිසිට්පත් පරිපාලන නිලධාරි, ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පි විදුහල, ගල්කුලම, අනුරාධපුරය වෙත ඉදිරිපත්කිරීමෙන් නියමිත ටෙන්ඩර්පත් සහ කොන්දේසි මාලාවේ පිටපත ලබාගත හැකිය.ටෙන්ඩර්පත් නිකුත්කිරීම් අවසන් දින **2025.12.08** දින ප.ව **03.30**ට අවසන් වනු ඇත.

1. ටෙන්ඩර් පත් මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම කවර වල බහා මුද්‍රා තැබූ ලියුම් කවර වල වම් උඩ කෙළවරේ "ආපනශාලා පවත්වාගෙන යාම OTC ආයතනය ගල්කුලම,අනුරාධපුරය-2026" යනුවෙන් සඳහන් කල යුතුය. ටෙන්ඩර්පත් 2025.12.09 දින ප.ව 02.30 ට පෙර ගල්කුලම, අනුරාධපුර ඕටිසි ආයතනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාර දිය හැක.

2. එම ලංසු භාරගන්නා වේලාව අවසන්වූ වහාම ගල්කුලම, අනුරාධපුර ඕටිසි ආයතනයේදී 2025.12.09 වන දින ප.ව 2.30ට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.

සභාපති ,
ප්‍රසම්පාදන මණ්ඩලය
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,
"සව්සිරිපාය"
අංක 123 , , විජේරාම මාවත ,
කොළඹ 07
දු.ක. - 0252050520 / 0112696166